# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/38 - 2012 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2012.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 132/29(ii).

**රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥා පනත**

(283 වැනි අධිකාරය වූ) රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥා පනතේ 16 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමය විසින් සාදනු ලැබ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ රීති.

ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2012 ක් වූ ජූලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

රීති

කලින් කළ සංශෝධිත හා 2008 මැයි මස 02 වැනි දින අංක 1548 දරන ගැසට් පත්‍රය මගින් අවසන්වරට සංශෝධිත 1892 ජුනි මස 17 වැනි දින අංක 5147 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

2010 ජූලි 14 වැනි දිනැති අංක 1662/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රීති මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

(1) 1 වැනි පරිච්ඡේදය - "පොදු ව්‍යවස්ථා" යන ශීර්ෂය යටතේ

(*අ*) (1) (i) වන රීතියේ "අවුරුදු 40 හෝ" යන ඉලක්කම් හා වචන වෙනුවට අවුරුදු 45 හෝ" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් ;

(*ආ*) (1) (ii) වන රීතියේ "වයස අවුරුදු 40 හෝ ඊට අඩු" යන ඉලක්කම් හා වචන වෙනුවට" අවුරුදු 45 හෝ ඊට අඩු" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් ;

(*ඇ*) (3) රීතිය වෙනුවට පහත දැක්වෙන නව රීතිය ආදේශ කිරීමෙන් ඃ

"සෑම සාමාජිකයෙකුටම පාස් පොතක් සැපයිය යුතු ය. එය සංගමය මගින් සපයන මුද්‍රිත ආකෘතියක් මගින් මුද්‍රණය කල එකක් හෝ විද්‍යුත් ක්‍රමවේදයක් මගින් නිර්මාණය කළ හෝ උත්පාදනය කළ එකක් විය යුතු ය.";

(*ඈ*) 4 (ii) රීතියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :-

"(iii) මාසිකව දායක මුදල් වශයෙන් අයකරනු ලබන මුදලට අමතරව මාසිකව මුදල් තැන්පත් කළ හැකි රු.100/- ගුණිතයන්ගෙන් සංයුක්ත විශේෂ ඉතිරි කිරීමක් කළ හැකි ය. ඒ සඳහා සියයට දහයක (10%) වාර්ෂික පොලියක් ගෙවිය යුතු ය. එම තැන්පත් කාලය වර්ෂ දෙකක් සම්පූර්ණ වීමෙන් පසු එකතු වූ මුදල ආපසු ලබා ගැනීම හෝ එම තැන්පත් මුදල මත සියයට දොළහක (12%) වාර්ෂික පොලියට ණය මුදලක් ලබා ගැනීමට හැකි විය යුතු ය.";

1A - G 16672— 340 (2012/09)

(ඉ) 6 රීතියේ -

(1) (අ) අනුරීතියේ (i) වන ජේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ජේදය ආදේශ කිරීමෙන් :-

"රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යවනු ලැබූ හෝ නිලය අහෝසි කිරීම නිසා තනතුර අහිමි වූ සහ 7(අ) රීතියේ අතුරු විධානය යටතේ සාමාජිකත්වය අහිමි සාමාජිකයෙකුට වයස අවුරුදු 55 සම්පූර්ණ වූ වහාම හෝ ඊට පසුව තමා ගෙවා තිබෙන සම්පූර්ණ දායක මුදල සහ තමාගේ නමින් බැරට ඇති පොලිය තමා විසින් රීති 12 හා 13 යටතේ ලබා ගෙන ඇති සියළු ණය හෝ අත්තිකාරම් මුදල් වලින් තම අභිමතය පරිදි තවදුරටත් ගෙවීමට ශේෂව තිබෙන ප්‍රමාණය අඩුකර ඉතිරියක් ඇත්නම් ලබා ගත හැකි අතර ඊට පසුව ඔහු "ප්‍රදානමික සාමාජිකයෙකු" වශයෙන් හඳුන්වනු ලැබේ. තවද ඔහු නැවත දායක මුදල් ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් " දායක මුදල් ගෙවන ප්‍රදානමික සාමාජිකයෙකු" වශයෙන් හඳුන්වනු ලැබේ.";

(2) (අ) අනුරීතියේ (ii) වැනි ජේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ජේදය ආදේශ කිරීමෙන් :-

"ඉහත අංක 6(අ) (1) රීතියෙන් ඉඩ ලැබෙන පරිදි තමා නමට තිබෙන දායක මුදල් සහ පොලිය ඉවත් කර නොගෙන ඒ වෙනුවට රීති 12 හා 13 යටතේ තමා ලබාගෙන තිබෙන සියළු ණය හෝ අත්තිකාරම් මුදල් වලට එරෙහිව හර කිරීමටත් අවශ්‍ය නම්, එයට පසු සාමාන්‍ය සාමාජිකයෙකුට ඇති අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳිමින් තව දුරටත් සාමාජිකත්වයේ රැඳී සිටීමට පුළුවන.";

(ඊ) 7 වන රීතියේ -

(1) (ආ) (ii) ජේදයේ "අවුරුද්දකට සියයට අට ගනනේ වූ පොලියක් ද" යන වචන වෙනුවට "අවුරුද්දකට සියයට දහය ගනනේ වූ පොලියක් ද" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (ඇ) (ii) ජේදය වෙනුවට පහත දැක්වෙන අළුත් ජේදය ආදේශ කිරීමෙන් :-

"යම් සාමාජිකයෙකුගේ කලත්‍රයා හෝ සුජාත දරුවන් හෝ නීත්‍යානුකූල උරුමක්කාරයෙක් ජීවත්ව නොමැති නම් රීති 10 යටතේ ලැබීමට හිමිකම ඇති මරණ ප්‍රදානය තමන් කැමති ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට ගෙවන ලෙස නියම කිරීමට ඕනෑම සාමාජිකයෙකුට හැකි ය. එකී නම් කිරීම සාමාජිකයාගේ මරණය සිදුවීමට යටත් පිරිසෙයින් මසකට පෙර විය යුතු ය.";

(උ) 10 (අ) (ii) රීතියේ (ඇ) ජේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ජේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලේ අතිරික්ත මුදල් සාමාජිකයින්ට ණය ලබා දීම සඳහා හෝ මහා භාණ්ඩාගාරය අනුමත කරන ආයෝජනයන්හි යෙදවීම පිළිබඳව කළමනාකරණ කමිටුව තීරණය කළ හැකි ය. එසේම ඒ මත උපචිත වන පොලිය මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලට බැර කල යුතු ය. මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලේ මුදල් සාමාජිකයින්ට ණය ලබා දීමට යොදවා ගන්නේ නම්, 13(iii) ආ රීතිය යටතේ සඳහන් වැටුප් ණය ගෙවීම සඳහා යොදවා ගත යුතු අතර එම ණය වර්ගය සඳහා තත්කාලයේ අයකරනු ලබන පොලියෙන් පරිපාලන වියදම සඳහා 1% ක් අඩුකර ඉතිරිය වාර්ෂිකව මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලට බැර කළ යුතු ය."

(ඌ) 13 වන රීතියේ -

(1) (ii) ජේදය වෙනුවට පහත අලුත් ජේද ආදේශ කිරීමෙන් :-

"(අ) 13 (1) රීතිය යටතේ ප්‍රදානය කරනු ලබන වැටුප් ණය මුදලක් මෙහි පහත "හිමි ණය මුදල්" නම් වගුවෙහි 1 වන තීරයේ විශේෂ කොට දක්වා ඇති එක් එක් අවස්ථා වල දී එකී වගුවෙහි II තීරයේ හෝ III තීරයේ විශේෂ කොට දක්වා ඇති සංඛ්‍යාවේ උපරිමයට වඩා වැඩි නොවිය යුතු ය;

"(ආ) 13 (අ) සහ 14 රීති යටතේ දැනටමත් ණය මුදලක් ප්‍රදානය කරනු ලැබ ඇති (විශ්‍රාම ගිය සහ දායක මුදල් හිලව් කළ ප්‍රදානමික) සාමාජිකයෙකු සම්බන්ධයෙන් වූ විට, එම ණය මුදල් මත අයවිය යුතු පොලිය සමග ගෙවීමට ශේෂව ඇති මුදල සම්පූර්ණයෙන්ම අයකර ගැනීමෙන් පසුව පමණක් 13(II) (අ) "හිමි ණය මුදල්" නම් වගුවෙහි 7 වන අයිතමය යටතේ සඳහන් ණය මුදලක් ගෙවීමට ක්‍රියා කළ යුතු ය;

"(ඇ) 13 (II) (අ) රීතිය යටතේ ණය මුදලක් ප්‍රදානය කරනු ලැබූ යම් විශ්‍රාමික සාමාජිකයෙකුට 13(ඉ) යටතේ හැර මෙහි අඩංගු වෙනත් රීතියක් යටතේ එනම් 13(අ) සිට 13 (ක) දක්වා වූ යම් ණය මුදලක් ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය;

"(ඈ) මෙම රීතිය යටතේ ලබා ගත හැකි උපරිම ණය මුදල සාමාජිකයාගේ ඒකාබද්ධ වැටුප හෝ විශ්‍රාම වැටුප මෙන් දොළොස් ගුණයක් නොඉක්මවිය යුතු ය."

හිමි ණය මුදල් වගුව

| | සාමාජිකත්ව කාලසීමාව | දායක මුදල 5% ට අඩු | දායක මුදල 5% ට වැඩි | ණය මුදල පියවීම සඳහා අයකරන වාරික | අදාළ වෙනත් අවශ්‍යතාවයන් |
|---|---|---|---|---|---|
| | I තීරය | II තීරය | III තීරය | IV තීරය | V තීරය |
| 01 | අවු. 1 ට අඩු | රු.5,000/- | රු. 10,000/- | 10 | අවුරුදු 5 ට වැඩි සාමාජිකත්වය ඇති සාමාජිකයෙකු ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය. |
| 02 | අවු. 1 ට වැඩි අවු. 3 ට අඩු | රු. 15,000/- | රු. 20,000/- | 20 | - එම - |
| 03 | අවු. 3 ට වැඩි අවු. 5 ට අඩු | මාස 2ක ඒකාබද්ධ වැටුප (උපරිමය රු. 25,000/-) | මාස 3ක ඒකාබද්ධ වැටුප (උපරිමය රු. 30,000/-) | 36 | සේවය ස්ථිර කිරීම අවශ්‍ය වේ. අවුරුදු 5ට වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකු ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය. |
| 04 | අවු. 5ට වැඩි අවු. 7ට අඩු | මාස 4ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 40,000/-) | මාස 5ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 50,000/-) | 48 | සේවයේ ස්ථිර කිරීම අවශ්‍ය වේ. |
| 05 | අවු. 7ට වැඩි අවු. 12 ට අඩු | මාස 6ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 60,000/-) | මාස 8ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 70,000/-) | 48 | - එම - |
| 06 | අවු. 12 ට වැඩි | මාස 6ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 80,000/-) | මාස 8ක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 1,00,000/-) | 48 | - එම - |
| 07 | වයස අවුරුදු 55ට එළඹීමට පෙර විශ්‍රාම ගෙන තම ණය මුදල් දායක මුදලින් හිලව් කර ඇති සාමාජිකයෙකුට වයස අවු. 55 සම්පූර්ණවන තෙක් | මාස 3ක විශ්‍රාම වැටුප (උපරිමය රු. 15,000/-) | මාස 5ක විශ්‍රාම වැටුප (උපරිමය රු. 30,000/-) | 48 | විශ්‍රාම වැටුපෙන් අයවිය යුතු ය. දායක මුදලින් අඩකට සීමා කෙරේ. 5% දායක මුදල දිගටම ගෙවිය යුතු ය. |
| 08 | 14 වැනි රීතිය යටතේ ණය ලබා නොගත් අවු. 35 ට අඩු ප්‍රදානමික සාමාජිකයෙකුට | මාස 4ක විශ්‍රාම වැටුප (උපරිමය රු. 25,000/-) | - | 48 | 14 වැනි රීති යටතේ ණය ලබා ගැනීමට හිමිකම් නොමැත. විශ්‍රාම වැටුපෙන් වාරික මුදල් අයකර ගත යුතු ය. |
| 09 | 14 වැනි රීතිය යටතේ ණය ලබා නොගත් අවු. 35 ට වැඩි ප්‍රදානමික සාමාජිකයෙකුට | මාස 4ක විශ්‍රාම වැටුප (උපරිමය රු. 35,000/-) | - | 48 | 14 වැනි රීති යටතේ ණය ලබා ගැනීමට හිමිකම් නොමැත. විශ්‍රාම වැටුපෙන් වාරික මුදල් අයකර ගත යුතු ය. |
| 10 | දායක මුදල් ආපසු ලබා ගෙන නැවත දායක මුදල් ගෙවන ප්‍රදානමික සාමාජිකයෙකුට | මාස 4ක විශ්‍රාම වැටුප (උපරිමය රු. 35,000/-) | - | 48 | 14 වැනි රීති යටතේ ණය ලබා ගැනීමට හිමිකම් නොමැත. විශ්‍රාම වැටුපෙන් වාරික මුදල් අයකර ගත යුතු ය. |

(2) (vii) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :-

" රීති 12 සහ 13 (1) යටතේ ලබා ගෙන ඇති වැටුප් ණය මුදල් සඳහා හැර අනෙකුත් රීති යටතේ ලබා ගත් ණය මුදල් සඳහා අප්‍රේල් සහ දෙසැම්බර් මාස වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති පරිදි මාසික ණය වාරික අයකර ගත යුතු ය."

(3) (vii) ඡේදය ඉක්බිතිව, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(vii) රීති 4 යටතේ සඳහන් වී ඇති පරිදි තම මූලික වැටුපෙන් 10% ක් හෝ ඊට වැඩි දායක මුදලක් ගෙවන සාමාජිකයෙකු වෙත රීති 12 සහ 13 යටතේ ගෙවා ඇති ණය මුදල් ප්‍රමාණය ඔහුගේ නමින් සංගමයේ පොත්වල සටහන් වී ඇති දායක මුදල හා එකතු වී ඇති ලාභාංශ ප්‍රමාණයේ එකතුවට වැඩි නොවන විට තවදුරටත් ණය මුදල් ලබා දීමේ බලය සභාපතිතුමාට ඇත්තේ ය."

(4) 13 අ රීතියට ප්‍රතිලාභ ලබන්නන් ලෙස "කලත්‍රයා අවිවාහක දරුවන්" යන වගන්තිය ඇතුළත් කිරීම හා පහත සඳහන් සංශෝධන ආදේශ කිරීමෙන් :-

(i) "මාසික වාරික" යන වචන වෙනුවට "පොලී රහිත මාසික වාරික" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) "මාස 3" යන ඉලක්කම් හා වචන වෙනුවට "මාස හය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(iii) 13(අ) රීතිය, 13(අ)(i) යනුවෙන් අංක කිරීමෙන් ;

(iv) 13(අ) රීතියේ (i) ඡේදයට ඉක්බිතිවම, නව ඡේදයක් ඇතුළත් කිරීමෙන් :-

"(ii) රීති අංක 13 අ(1) හි සඳහන් ආපදා ණය මුදල වෙනුවෙන් එහි සඳහන් මුදලට අමතරව වාර්ෂිකව 8% පොලිය සහිතව අනුගාමී මාසික වාරික 40 කින් අයකර ගනු ලබන රු.50,000/-ක ණය මුදලක් ද ගෙවිය හැකි ය.";

(5) 13 (ආ) රීතියේ -

(i) ඡේදයේ "අවුරුදු එකක්" යන වචන වෙනුවට "අවුරුදු එකක" යන වචන ආදේශ කිරීමෙන් ද " රු. 10,000/- ක" යන වචන සහ ඉලක්කම් වෙනුවට "රු. 50,000/-ක" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) 13(ආ) යන රීතිය 13(ආ)(i) යනුවෙන් අංක කිරීමෙන් ;

(iii) පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් ;

"(ii) අවුරුදු එකක සාමාජිකත්වය සම්පූර්ණ කර නොමැති සාමාජිකයකුට අවුරුදු පහට වැඩි සාමාජිකත්වය ඇති තැනැත්තකු ඇපයක් ලෙස ඉදිරිපත් කිරීමෙන් මෙම ණය මුදල ලබා ගත හැක.";

(6) 13 (ඇ) රීතියේ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්

"එක් වර්ෂයක සාමාජිකත්වයක් සම්පූර්ණ කළ යම් සාමාජිකයකුට මාසික වාරික දහය (10) හි අදාළ පොලී සහිත ආපසු ගෙවනු ලබන රු. 10,000/- උත්සව ණය මුදලක් ගෙවිය හැකි ය."

(7) (i) 13(ඈ) රීතියේ "රු. 10,000/-" යන වචන හා ඉලක්කම් වෙනුවට "රු.50,000/-" යන්න ආදේශ කිරීමෙන් :-

(ii) "8%" යන ඉලක්කම වෙනුවට "10%" යන ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(iii) "3" යන ඉලක්කම වෙනුවට "6" යන ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(8) 13 (ඊ) රීතිය වෙනුවට පහත දැක්වෙන නව රීතිය ආදේශ කිරීමෙන් :-

සාමාජිකයෙකුගේ පළමුවන සහ දෙවන ළමයා ඉපදී අවුරුද්දක් ඇතුළත එම ළමයාගේ උප්පැන්න සහතිකය සංගමය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, රු. 7,500/- නොඉක්මවන ණය මුදලක් ඒ මත පොලී සහිතව එකී සාමාජිකයාට ලබා දිය යුතු ය. මෙම ණය මුදල මාසික වාරික 24කින් අයකරනු ලැබිය යුතු ය.

(9) 13 (උ) රීතියේ "රුපියල් දස දහසක් (රු.10,000/-)" යන වචන හා ඉලක්කම් වෙනුවට "රුපියල් පනස් දහසක් (රු. 50,000/-)" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ද, "මාසික වාරික 36" කින් යන වචන හා ඉලක්කම් වෙනුවට "මාසික වාරික 40 කින් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ද, "සියයට එකොළහක (11%)" යන වචන හා ඉලක්කම් වෙනුවට "සියයට දහයක (10%)" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්

(10) 13(උ) රීතියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් රීති ඇතුළත් කිරීමෙන් :-

"(ඌ) වසර දෙකකට වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයාට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ අවිවාහක දරුවන්ට ඇස් කණ්නාඩි මිල දී ගැනීම සඳහා වසර පහකට වරක් රු. 5,000/- ක් උපරිමය දක්වා වාරික 20 කින් ආපසු ගෙවිය යුතු ණය මුදලක් වාර්ෂිකව 10% පොලී ප්‍රතිශතය මත ගෙවිය හැකි ය. මෙම ණය මුදල වසර පහකට වරක් සහ ප්‍රදානමික සාමාජිකයින්ට ද ලබා ගත හැක.

එසේ වුව ද, මෙම ණය මුදල සාමාජිකයාගේ මෙම මාසයේ වැටුපෙන් 40%ක උපරිම අඩුකිරීමේ සීමාවකට යටත්ව සාමාජිකයාගේ මාසික වැටුපෙන් වාරික අඩුකර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගැනීමෙන් පසු පමණක් ප්‍රදානය කළ යුතු ය.

"(එ) (i) මහජන බැංකුව හෝ ලංකා බැංකුව වැනි පිළිගත් ආයතන මගින් ක්‍රියාත්මක කරන (විදේශීය) වන්දනා ගමන් සඳහා සංගමය මගින් උපරිම රු.50,000/- ක ණය මුදලක් ලබා දෙමින් කණ්ඩායම් හෝ පුද්ගල වශයෙන් එම ආයතනය වෙත යොමු කරනු ලැබේ. ගමන සඳහා වැය වන ඉතිරි මුදල සාමාජිකයින් විසින් එක් වර සංගමයේ තැන්පත් කළ යුතු අතර සංගමය විසින් ගුවන් ටිකට් පත් සඳහා ගෙවීම කරනු ලැබේ.

(ii) වර්ෂ 5ක සාමාජිකත්වයක් සම්පූර්ණකර ඇති සේවය ස්ථිර කර ඇති දායකත්ව සාමාජිකයින් පමණක් මේ සඳහා සුදුසුකම් ලබයි.

(iii) අඛණ්ඩ වාරික 25කින් 15% වාර්ෂික පොලී ප්‍රතිශතය මත සම්පූර්ණ ණය මුදල ආපසු ගෙවිය යුතු ය.

(iv) ණය මුදල වෙනුවෙන් වසර පහකට වැඩි දායකත්වය ඇති සාමාජිකයෙකු ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් කළ යුතු යි.

"(ඒ) (i) දේශීය සංචාර හෝ වන්දනා ගමන්, ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සහ උගසට තබා ඇති රන් භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා දායකත්ව සාමාජිකයෙකුට මෙම රීතිය යටතේ පහත දැක්වෙන විධිවිධානයන්ට අනුකූලව පොලී සහිත ණයක් දීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) වර්ෂ දෙකක් සාමාජිකත්වය සම්පූර්ණ කර ඇති දායකත්ව සාමාජිකයින් මේ සඳහා සුදුසුකම් ලබයි.

(iii) උපරිම ණය මුදල රු. 30,000/-

(iv) අඛණ්ඩව වාරික 20කින් 15% වාර්ෂික පොලී ප්‍රතිශතය මත සම්පූර්ණකර ණය ආපසු ගෙවිය යුතු ය.

(v) ණය මුදල ලබා ගැනීමේදී වසර දෙකකට වැඩි දායකත්වය ඇති සාමාජිකයෙකු ඇපකරු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(එ) 13 (ඒ) රීතියට ඉක්බිතිව, පහත දැක්වෙන නව රීතීන් ඇතුළත් කිරීමෙන් :-

"ඔ (i) සංගමයේ සාමාජිකත්වය අවුරුදු 05ක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය සේවයේ ස්ථිර කරනු ලැබ ඇත්තා වූ සාමාජිකයින්ට හා ඔවුන්ගේ දරුවන්ට අවශ්‍ය පොත් පත් මිල දී ගැනීම සඳහා වාර්ෂික 10% පොලී ප්‍රතිශතයක් මත, වාරික 10 කින් ආපසු අයකරනු ලබන රු. 10,000/- ක විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි ය.

එසේ වුවද, සංගමයේ සාමාජිකත්වය අවුරුදු පහක් සම්පූර්ණ කර නොමැති සාමාජිකයින්ට සංගමයේ සාමාජිකත්වය අවුරුදු පහකට වැඩි සාමාජිකයෙකු ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් කිරීමෙන් මෙම අත්තිකාරම් මුදල ලබා ගත හැකි ය.

(ii) සාමාජිකයන් සඳහා පරිගණකයක් මිලදී ගැනීම සඳහා වාර්ෂික පොලිය 10% බැගින් අනුගාමී මාසික වාරික පනහකින් අයකරනු ලබන රු. 75,000/- ණය මුදලක් ගෙවිය හැක. වසර 5ක සාමාජිකත්වයක් සපුරා නොමැති සාමාජිකයින්ට වසර 5 කට වැඩි සාමාජිකයෙකු ඇපකරු වශයෙන් ඉදිරිපත් කිරීමෙන් මෙම ණය මුදල ලබා ගත හැක." ;

(ඒ) 14 රීතියේ -

(1) "සියයට තුන ගණනේ එකතුවන සුළු පොලියක්" යන වචන වෙනුවට" "සියයට හතර ගණනේ එකතුවන සුළු පොලියක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (1) ඡේදයේ "ජ්‍යෙෂ්ඨතම සාමාජිකයින් විසිපස් දෙනා ගෙන්" යන වචන වෙනුවට "ජ්‍යෙෂ්ඨතම සාමාජිකයින් පනස් දෙනා ගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; ද "එක් වරක් පමණක් ගෙවනු ලබන්නා වූ ද රුපියල් දෙදහස් පන්සියයක් (රු.2500/-) ප්‍රදානයක් කළ යුතු ය." යන වචන හා ඉලක්කම් වෙනුවට "එක් වරක් පමණක් ගෙවනු ලබන්නා වූ රුපියල් පන්දහසක් (රු. 5,000/-) ප්‍රදානය කළ යුතු ය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) 2 ඡේදයේ "මාස තුනක කාලයක් ඇතුළත" යන වචන වෙනුවට "මාස හයක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) 14 (3) රීතියේ (iii) ඡේදය අවලංගුකර ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"ජීවිත තර්ජනයක් සහිත රෝගයකින් සාමාජිකයාගේ ජීවිතය බේරා ගැනීම සඳහා තමා ඔහු ශල්‍ය කර්මයකට භාජනය කළ බව වෛද්‍ය වෘත්තිකයා විසින් සනාථ කර තිබීම අත්‍යාවශ්‍යය" ;

(5) 14(3)(iv) ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන නව ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(v) ප්‍රතිකාර ලබා ගැනීම සඳහා හෝ ශල්‍ය කර්මයට පෙර වෛද්‍යාධාර ප්‍රදානය කරනු නොලැබේ.

(vi) අක්ෂි ශල්‍ය කර්ම සඳහා වෛද්‍යාධාර ප්‍රදානය කළ හැක." ;

(6) 14(3) රීතියට ඉක්බිතිව පහත දැක්වෙන නව රීති ආදේශ කිරීමෙන් :-

"(4) ඕනෑම වෛද්‍යාධාරයක් ගෙවීමේදී අරමුදලේ මුදල් තත්ත්වය සලකා ගෙවීම තීරණය කිරීමේ බලය කළමනාකරණ කමිටුව සතු ය.

(5) ජීවිත කාලය තුළ ලබාගත හැකි උපරිම වෛද්‍යාධාර මුදල රු. 50,000/- ලබා ගන්නා සාමාජිකයෙකු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වුවහොත් ඔහු විසින් වෛද්‍යාධාර අරමුදලට තමාගේ දායකත්ව මුදල අඩු කොට ශේෂය සංගමයට මුදලින් ගෙවන බවට (වෛද්‍යාධාර මුදල් ලබා ගන්නා අවස්ථාවේ) ප්‍රකාශයට අත්සන් තැබීම අත්‍යාවශ්‍යය." ;

(ඔ) 15(i) රීතියේ "රුපියල් දෙකකට නොඅඩු මාසික කොටස් හැටකට නොවැඩි ගණනකින් " යන වචන වෙනුවට "මාසික කොටස් හතළිස් අටකට නොවැඩි ගණනකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඕ) 16 රීතියේ (ii) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(iii) පෞද්ගලික හේතුමත, තම මාසික වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් 12 රීති හෝ 13 රීති යටතේ ලබා ගත් ණය මුදල් වෙනුවෙන් අයවිය යුතු කොටස් මුදල හා පොලිය සහ (ii) වන පරිච්ජේදය යටතේ ගෙවන ලද දේපල ණය වෙනුවෙන් අයවිය යුතු කොටස් මුදල් හා පොලිය තම මාසික වැටුපෙන් අයකර එවීමට නොහැකි වන සාමාජිකයින්ට වර්ෂයකට එක් වරක් සභාපතිවරයාගේ හෝ ඔහුගෙන් ලිඛිතව බලයලත් නිලධාරියෙකුගේ අවසරය ලබා අඛණ්ඩ මාස 3ක් සංගමය වෙත හෝ තමන්ට ආසන්න බැංකුවක් වෙත මුදල් ගෙවීමට අවස්ථාව ලබා දිය යුතු ය. එසේ වුව ද දායක මුදල මරණ ප්‍රදානමික වාරිකය හා වෛද්‍යාධාර දායක මුදල වැටුපෙන් ප්‍රේෂණය කළ යුතු ය." ;

(ක) 17 රීතියේ (ii) ඡේදය වෙනුවට පහත සඳහන් නව ඡේදය ආදේශ කිරීමෙන් :-

"13 වන සහ 14 රීතිය යටතේ ප්‍රදානය කරන ලද ණය වෙනුවෙන් (එක් එක් මුදල් වර්ෂයක් තුළ දී අයකර ගනු ලබන පොලියෙන් සියයට බිංදුවයි දශම පහකට (0.5%) (සමාන වූ මුදලක්) උක්ත ණය කරන කොට ගෙන ඇතිවිය හැකි බොල් ණය පියවා ගැනීම සඳහා සංචිතයක් වශයෙන් වෙන්කළ යුතු ය. උක්ත සංචිතයේ තිබිය යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීමේ බලය පාලක කමිටුවට ඇත්තේ ය." ;

(ග) නැවත අංක කරන ලද 18(i) රීතියට පසුව පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ii) සෑම ණය ඉල්ලුම් පත්‍රයක් සමගම ණය ප්‍රධාන ගිවිසුමක් සහ සම්පූර්ණ කල ඇපකරයද සම්පූර්න කොට අත්සන් තබා අමුණා තිබීම අත්‍යාවශ්‍යය" ;

(ච) 19 රීතියේ (ii) ඡේදය අවලංගුකර ඒ වෙනුවට පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් :

"(i) ශුද්ධලාභයෙන් කළමණාකරණ කමිටුව තීරණය කරනු ලබන කොටසක් ගොඩනැගිලි අරමුදලට වෙන්කල යුතුය.

"(ii) ගොඩනැගිලි අරමුදල සාමාජිකයින්ට ණය ලබා දීමට යොදවා ගන්නේ නම් මෙම ව්‍යවස්ථාවෙහි 13 වැනි රීතිය යටතේ සඳහන් වැටුප් ණය ගෙවීම සඳහා යොදවා ගත යුතු අතර එම ණය වර්ගයන් සඳහා තත්කාලයේ අයකරනු ලබන පොලියෙන් පරිපාලන වියදම සඳහා සියයට එකක් (1%) ක් අඩු කර ඉතිරිය වාර්ෂිකව ගොඩනැගිලි අරමුදලට ලබා දිය යුතු ය.

(iii) එක් එක් සාමාජිකයාගේ (කේවල) ගිණුම් වල සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට බැරට ඇති සාමාජික ඉතිරි කිරීම් ශේෂය හා එදිනට පොලී ගිණුමේ ඇති ශේෂය පදනම් කොට ගෙන 5% වාර්ෂික පොලී ප්‍රතිශතයක් ඒ ඒ ගිණුම් වලට බැර කළ යුතු බවත් වර්ෂය තුළ මියයන හා සාමාජිකත්වයෙන් ඉවත් වන සාමාජිකයින් සඳහා සමානුපාතිකව මෙම පොලී ප්‍රමාණය ගෙවිය යුතු ය. සංගමයේ ආදායම් තත්ත්වය සලකා බලා පොලී ප්‍රතිශතය සංශෝධනය කිරීමට කළමනාකරණ කමිටුවට බලය පැවරෙන්නේ ය" ;

(ජ) 22 රීතියේ "සාමාජිකයින් 100ක් " යන වචන හා ඉලක්කම් වෙනුවට "සාමාජිකයින් 60ක් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ට) නැවත අංක කරන ලද 25(i) රීතියට පසුව පහත දැක්වෙන නව ජේදය ඇතුළත් කිරීමෙන් :-

(ii) තැපැලෙන් ලැබෙන හා අතේ ගෙනෙන සියළුම නාම යෝජනා ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික විසින් පෙට්ටියකට බහා මනාව මුද්‍රා තැබිය යුතු ය. ඉහත 25 රීතියෙහි සඳහන් පරිදි නාම යෝජනා කැඳවීමේ දැන්වීමේ සඳහන් අවසාන දින පැවැත්වෙන රැස්වීමේදී කළමනාකරණ කමිටුව ඉදිරියේ නාම යෝජනා විවෘත කළ යුතු ය. ඒ අවස්ථාවට අපේක්ෂකයාට පමණක් සහභාගි විය හැකි ;

(iii) නාම යෝජනා පත්‍රයේ කිසියම් වෙනසක් කිරීමට කළමනාකරණ කමිටුවට හෝ අපේක්ෂකයන්ට අවසර නොමැත. එවැනි නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඒ බව අපේක්ෂකයාට ලිඛිතව දැන්විය යුතු ය.";

(ඩ) 25 (iii) රීතියට ඉක්බිතිව පහත සඳහන් නව රීතිය ඇතුළත් කිරීමෙන් :-

"26 (i) දිස්ත්‍රික්, දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමක් මත සංගමයේ කටයුතු සම්බන්ධීකරණය සඳහා නියෝජිතයන් වශයෙන් සංගමයේම සාමාජිකයින් පත්කර ගැනීමට කළමනාකරණ කමිටුවට බලය ඇත්තේ ය."

(ii) රාජ්‍ය සේවයට හෝ පළාත් රාජ්‍ය සේවයට හෝ පළාත් පාලන සේවයට පත්වීම ලබන නවක නිලධාරීන් සංගමයට බඳවා ගැනීම, නියෝජිතයන් ලෙස පත්වීම ලබන සාමාජිකයින් වෙත පැවරිය හැක ;

(iii) මෙම නියෝජිතයන් මුදල් භාර ගැනීමක් නොකළ යුතු ය. නියෝජිතයන් වශයෙන් පත්වීම් ලබන සාමාජිකයන් සමග කළමනාකරණ කමිටුව කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹිය යුතු ය. මෙම නියෝජිතයන්හට දීමනාවක් ගෙවීම සඳහා කළමනාකරණ කමිටුවට බලය ඇත්තේ ය" ;

(iv) නියෝජිතයින්ගේ කාර්යයන් පහත පරිදි වේ :-

(*a*) සංගමයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරීම ;

(*b*) ණය අයදුම්පත් ඉදිරිපත් කිරීම ;

(*c*) සාමාජිකයන්ගේ මරණ පිළිබඳව සංගමය දැනුවත් කිරීම, ආදිය.";

(ණ) 26 වැනි රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන නව රීති ඇතුළත් කිරීමෙන් :-

"27 කළමනාකරණ කමිටුව විසින් පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු සංගමයේ ගිණුම් පරීක්ෂාව සිදුකරනු ලැබිය යුතු ය.

28 (i) සංගමයේ සේවකයන්ට වාර්ෂික ප්‍රසාද දීමනාවක් "ප්‍රසාද දීමනා අරමුදල" මගින් ලබා දිය යුතු අතර කළමනාකරණ කමිටුව අනුමත කරන මුදලක් වාර්ෂිකව මෙම අරමුදලට බැරකළ යුතු ය. මෙම අරමුදල සඳහා වෙනම ගිණුම් පවත්වා ගෙන යා යුතු ය.

(ii) කළමනාකරණ කමිටුවේ හා සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමේ දී ගන්නා අනුමැතිය මත ප්‍රසාද දීමනා ගෙවිය යුතු ය."

(2) II වන පරිච්ජේදය යන ශීර්ෂය යටතේ

(*අ*) 3 රීතියට පසුව පහත සඳහන් නව රීතිය ඇතුළත් කිරීමෙන් :-

"මෙම රීතියේ කාර්යයන් සඳහා "නීති උපදේශක" යන්නෙන්, කළමනාරකණ කමිටුව විසින් පත් කරනු ලැබූ නීතිඥවරුන් අදහස් වේ.";

(*ආ*) 5 රීතියේ (i) ජේදය අවලංගුකර ඒ වෙනුවට පහත සඳහන් නව ජේදය ඇතුළත් කිරීමෙන් :-

"පළමු රු. 50,000/- සඳහා අයකර ගත යුතු පොලී ප්‍රමාණය වර්ෂයකට 10% කි. ඉතිරි රු. 4,50,000/- සඳහා අයකර ගත යුතු පොලී ප්‍රමාණය වර්ෂයකට 12%කි.";

(*ඇ*) 8 වන රීතියේ "අඩුම ගාස්තුව රු. 5කි." යන වචන හා ඉලක්කම් වෙනුවට, "අඩුම ගාස්තුව රු. 500කි." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) 10 රීතිය අවලංගුකර ඒ වෙනුවට පහත දැක්වෙන නව රීතිය ආදේශ කිරීමෙන් :-

(i) ණය මුදල මාසික (උපරිම) වාරික 240 කින් ගෙවා නිම කළ යුතු ය.
(ii) ණය මුදල හා පොලී මුදල ලිත් මාසික වාරික වශයෙන් මාසික වැටුපෙන් අයකළ යුතු ය.
(iii) ණය මුදල නිකුත් කළ දින සිට එම මස අවසන් වීමට ඇති දින ගණන ගණනය කර එම දින ගණන සඳහා ඉහත 5 රීතියේ සඳහන් පොලී ප්‍රතිශත අනුව එකතු පොළියක් ගණන් බලා ණය මුදල ගෙවන අවස්ථාවේ දීම එම මුදල අයකර ගත යුතු ය.
(iv) මුල් මුදලේ කොටස හා පොලිය නියමිත මාසයට පසු මාසයේ 10 වන දිනට පෙර නොගෙවූවහොත් එම මුදල් කොටස හා පොලිය ගෙවීම් පැහැර හැර ඇති සේ සැලකිය යුතු ය. තෙමසක් හෝ එයට වැඩි කාලයක් ගෙවීම් පැහැර හැර ඇති කල්හි කළමනාකරණ කමිටුව විසින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.
(v) මාසිකව ගෙවනු ලබන මුළු මුදලේ කොටස හා පොලිය නොකඩවා මාස හයක කාලයක් ගෙවීම් පැහැර හැර ඇති විට සංගමයේ නීතිඥයින් මගින් හිඟ වාරික අයකර ගැනීම සඳහා නීති මගින් ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා වැයවන සියලු වියදම් ණයකරුගෙන් අයකරගත යුතු අතර ඒ බව ණයකරු වෙත ද ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතු ය.

(ඉ) 12 රීතියේ (i) ජේදය වෙනුවට පහත දැක්වෙන නව ජේදය ආදේශ කිරීමෙන් :-

"නිවාස දේපළ ණය රුපියල් ලක්ෂ හතරකට (රු. 4,00,000/-) සීමා විය යුතු ය. ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනාම රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ සේවයේ නියුක්තව සිටී නම් ඒ දෙදෙනාම එකතුව රුපියල් පන් ලක්ෂයක (රු. 5,00,000/-) මුදලක් පමණක් ණයට ගැනීමට හිමිකම් ඇත." ;

(3) III වන පරිච්ජේදය යන ශීර්ෂය යටතේ -

(අ) 3 වන රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන නව රීතිය ඇතුළත් කිරීමෙන් :-

"(i) සාමාජිකයෙකුගේ දරුවකු ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට නම් සාමාජිකයාගෙන් සංගමයට අයවිය යුතු මාසික වාරික මුදල් අඛණ්ඩව අය වී තිබිය යුතු ය. ශිෂ්‍යත්වය ලබන කාලසීමාව තුළ වුව ද මාස තුනකට වඩා දායක මුදල් හිඟ පැවතීම ශිෂ්‍යත්වය අවලංගු කිරීමට හේතුවක් වනු ඇත." ;

(ආ) 8 වන රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන නව රීතිය ඇතුළත් කිරීමෙන් :-

"9. රීති 4 හා 8 යටතේ ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම් ලැබූවන් හැර අයදුම්පත් ඉදිරිපත් කරන ලද සාමාජික දරුවන්හට එක් වරක් පමණක් ගෙවන රු. 2,000/- ක ශිෂ්‍යාධාරයන් ගෙවනු ලැබිය හැකි ය. මෙම මුදල වාර්ෂික ප්‍රතිපාදන නොඉක්මවන ලෙස ගෙවීමට කළමනාකරණ කමිටුවට බලය ඇත.'';

(4) III වන පරිච්ජේදයට ඉක්බිතිව පහත සඳහන් නව පරිච්ජේද ඇතුළත් කිරීමෙන් ;

" IV වන පරිච්ජේදය - කාර්ය මණ්ඩල/සේවක ණය

*ආපදා ණය*

1. සේවකයා හා ඔහුගේ පවුලේ සාමාජිකයින්ගේ අසනීප තත්ත්වයන්ට ප්‍රතිකාර ගැනීම සඳහා හා වෙනත් ආපදාවන් සඳහා සේවකයාගේ මාසික ඒකාබද්ධ වැටුප මෙන් දස ගුණයක් ණය මුදලක්.

(i) මාසික වාරික 100න් ආපසු ගෙවිය යුතු අතර, වාර්ෂික පොලිය 8%කි.
(ii) ණය ලබා ගත් දින හා වාරික අයවන පළමු මාසය හෝ නියමිත අනුපාතය මත දින ගණනට එකතුවන පොලිය අයකර ගත යුතු ය.
(iii) මුල් ණය මුදල ලබා ගත් දින සිට මාස 06ක් ගත වූ පසු අයවී ඇති ශේෂය ලබා ගත හැකි ය.
(iv) වයස අවු. 55 සම්පූර්ණ වීමට ඇති සේවා කාලය ලිත් මාස 100 කට වඩා අඩුවන කල්හි අය නොවී ඉතිරි වන ශේෂය තම පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට කැමති බවට ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු ය.
(v) 40% අවකරණ සීමාව බලපානු ඇත.
(vi) ණය ඉල්ලුම්කරුට වසර පහක සේවා කාලයක් ඇත්නම් ඇප අවශ්‍ය නොවේ.
(vii) ඇප අවශ්‍ය නම් අවු. පහට වැඩි එක් අයෙකු හෝ දෙදෙනෙකු ඇපකරු වශයෙන් ලබාදිය යුතු ය.

*බයිසිකල් ණය*

2. ඕනෑම සාමාජිකයකුට බයිසිකලයක් මිලට ගැනීම සඳහා රු. 6,000/- ණය මුදලක්.

(i) වාර්ෂික පොලිය 10%කි. මාසික වාරික 20න් අයකර ගත යුතු ය.
(ii) වසර පහට වරක් මෙම ණය මුදල ලබා ගත හැකි අතර 40% ණය අවකරණ සීමාව බලපානු ඇත.

*ජංගම දුරකථනයක් මිලදී ගැනීම සඳහා ණය.*

3. ඕනෑම සාමාජිකයෙකුට ජංගම දුරකථනයක් මිලදී ගැනීම සඳහා රු. 10,000/- කට නොවැඩි ණය මුදලක් ලබා ගත හැකි ය.

(i) වාර්ෂික පොලිය 10%ක් වන අතර මාසික වාරික 20කින් අයකර ගත යුතු ය.
(ii) වසර දෙකකට වරක් මෙම ණය මුදල ලබාගත හැකි ය.

*ලිපි ද්‍රව්‍ය ණය*

4. තමන්ගේ දරුවන්ට පොත් මිල දී ගැනීම සඳහා රු. 2,500/- කට නොවැඩි ණය මුදලක් ලබා ගත හැකි ය.

(i) රු. 250/- බැගින් වූ මාසික වාරික වලින් සමාන වාර්ෂික පොලිය රු. 9.17කි.
(ii) මාසික වාරික 10කින් අයකර ගත යුතු අතර සෑම වාර්ෂයකම ජනවාරි මස අවසන් වීමට පෙර ඉල්ලුම් කළ යුතු ය.
(iii) පළමු ණය මුදල අයකර අවසන් වී නැත්නම් නැවත ලබා දෙනු නොලැබේ.

*උත්සව අත්තිකාරම්*

5. උත්සව අත්තිකාරම් මුදලක් වශයෙන් ද රු. 5,000/- නොවැඩි ණය මුදලක් ලබා ගත හැකි ය.

(i) වර්ෂයකට වරක් පැවැත්වෙන උත්සවයක් සඳහා ගෙවිය හැකි ය.
(ii) ඊළඟ වර්ෂයේ (වාර්ෂික) උත්සවය පැවැත්වීමට පෙර ආපසු අයකර ගත යුතු යි.
(iii) වාර්ෂික පොලිය 8%කි.
(iv) මාස 3 කට වැඩි සේවයක් ඇති නිලධරයන්ට සහ සේවකයන්ට අවු. පහට වැඩි සේවා කාලයක් ඇති නිලධාරයකුගේ ඇපයක් සහිතව ණය ලබා ගත හැකි ය.
(v) මුල් අවස්ථාවේ ලබා ගත් දිනට දින 14කට පෙර, ඊළඟ අවස්ථාවේ ණය මුදල ලබා ගත හැක.

6. ණය දීමේ සාමාන්‍ය කොන්දේසි පහත සඳහන් පරිදි විය යුතු යː-

(i) ණය මුදල අදාළ කාරණය සඳහාම යෙදවිය යුතු ය.
(ii) ඉතිරි මුදලක් ඇත්නම්, එය ආපසු මුදලින් තැන්පත් කළ යුතු ය.
(iii) අවශ්‍ය සියළුම ලියකියවිලි ණය අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.
(iv) ණය මුදල ගෙවා අවසන් වන තෙක් මුදල යොදවා අත්පත් කර ගත් දේපළ කළමනාකරණ කමිටුවේ අනුමැතියකින් තොරව බැහැර නොකළ යුතු ය.
(v) ණය මුදල ගෙවා අවසන් වීමට ප්‍රථම ලබා දී ඇති ඇපකරු සේවයෙන් ඉවත්ව යන්නේ නම් වෙනත් සුදුසු ඇපකරුවකු ලබා දෙන තුරු පළමු ඇපකරු නිදහස් නොකරනු ඇත.

7. (1) ණය ඉල්ලීමේ ආකෘති පත්‍රයෙහි අඩංගු විය යුතු කරුණු ː-

(i) සාමාන්‍ය ණය අයදුම්පත්‍රය.
(ii) ඇප ආකෘති පත්‍රය.
(iii) ගිවිසුම් පත්‍රය.

(2) අයදුම්කරුගේ මාසික වැටුපෙන් සියළු ණය වාරික හා පොලී අඩු කළ යුතු ය.

(3) අප්‍රේල් හා දෙසැම්බර් ඇතුලුව සෑම මසකම ණය වාරික හා පොලී අයකළ යුතු ය.

(4) ඕනෑම ණය මුදලක් අනුමත කිරීමේ බලය කළමනාකරණ කමිටුව සතු ය.

10 - 574

2 - G 16672 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.